**සිකුරාදා දේශනය (ප්‍රකාශනය සහ බෙදා හරින ලදී)**
**දිනය: 1448 සෆර් මස 17 / 2026 ජූලි 31 වනදා**

## දුක හා වේදනාවන්ට පිළියම් (සහනය)

සකල ප්‍රශංසා සහ ස්තුති අල්ලාහ්ටම හිමි ය. අපි ඔහුව ප්‍රශංසා කරමු, ඔහුගෙන් උපකාර පතමු, ඔහුගෙන් ක්ෂමාව අයැද සිටිමු. තවද අපගේ ආත්මයන්හි නපුරෙන් සහ අපගේ අයහපත් ක්‍රියාවලින් අප ව ආරක්ෂා කරන ලෙස අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමු. අල්ලාහ් යමෙකුට යහ මඟ පෙන්වන්නේ ද, ඔහු ව නොමඟ යැවීමට කිසිවෙකුට නොහැක. යමෙකු නොමඟ යවන්නේ ද, ඔහුට යහ මඟ පෙන්වීමට කිසිවෙකුට නොහැක. අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බවත්, ඔහු ඒකීය බවත්, ඔහුට කිසිදු සහකරුවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ ගැත්තා සහ දූතයාණන් වන බවට ද මම සාක්ෂි දරමි.

**«විශ්වාස කළවුනි, නුඹලා අල්ලාහ්ට බිය විය යුතු අයුරින් බිය වන්න. තවද (සැබෑ) මුස්ලිම්වරුන් ලෙස මිස නුඹලා මරණයට පත් නො වන්න.»**

(ආල ඉම්රාන්: 102)

**« මිනිසුනි, නුඹලා නුඹලාගේ පරමාධිපතිට බිය බැතිමත් වනු. ඔහු වනාහි නුඹලාව එක ම ආත්මයකින් නිර්මාණය කළේය. තවද එහි සහකාරිය ද ඉන් නිර්මාණය කළේ ය. ඒ දෙදෙනාගෙන් අධික වශයෙන් පිරිමින් හා ගැහැණුන් ව්‍යාප්ත කළේ ය. තවද නුඹලා එකිනෙකා කවර කරුණක (අයිතියක්) ඉල්ලා සිටින්නේ ද ඒ ගැන ද ලේ ඥාතීත්වය (බිඳ දැමීම) ගැන ද අල්ලාහ්ට බිය වනු. නියත වශයෙන් ම අල්ලාහ් නුඹලා කෙරෙහි සර්ව නිරීක්ෂකයා විය..»**

(අන්-නිසා: 1)

**« දේවත්වය විශ්වාස කළවුනි, නුඹලා අල්ලාහ්ට බැතිමත් වනු. තවද නිවැරදි ප්‍රකාශය ම කතා කරනු.»**

(අල්-අහ්සාබ්: 70)

නියත වශයෙන්ම වඩාත්ම සත්‍ය පුවත අල්ලාහ්ගේ වචනය (කුර්ආනය) යි. හොඳ ම මාර්ගෝපදේශය මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ මාර්ගෝපදේශය යි. නරක ම කරුණු වන්නේ (ආගමට අලුතින්) ඇතුළත් කරන ලද දේවල් ය. සෑම අලුතින් ඇතුළත් කළ දෙයක්ම ආගමේ නවෝත්පාදනයකි (බිද්අහ්). සෑම බිද්අතයක් ම නොමඟ යැවීමකි. තවද සෑම නොමඟ යැවීමක්ම නිරයේ ය.

**මුස්ලිම්වරුනි,** – අල්ලාහ් තආලා නුඹලාට කරුණාව දක්වත්වා – නියත වශයෙන්ම මෙලොව යනු පරීක්ෂණ සහ තක්සේරු කිරීම් සිදුකරන ස්ථානයක් බව දැනගන්න. රෝග, දුෂ්කරතා, විපත් සහ කනගාටුදායක සිදුවීම් හේතුවෙන් මිනිසාට ඇතිවන දුක මෙලොවෙහි ස්වභාවය යි. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**« සැබැවින්ම මිනිසා ව දැඩි දුෂ්කරතාවක අපි මැව්වෙමු.»**

(අල්-බලද්: 4)

එනම්: මිනිසා එහි කටයුතු සමඟ පොරබදමින් සහ ඒවාට මුහුණ දෙමින් සිටියි. එම නිසාම, කිසිදු විපතක් හෝ දුකක් නොමැති ස්ථානයක් ලෙස ස්වර්ගය ඇත. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**«එහිදී ඔවුන්ට කිසිදු වෙහෙසක් නොදැනෙන්නේය, තවද ඔවුන් එයින් පිටතට යවනු ලබන්නන්ද නොවෙති.»**

(අල්-හිජ්ර්: 48)

එහි වෙසෙන්නන්ගේ සිත් එකදු (අයහපත්) වචනයකින්වත් නො රිදෙන්නේය. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**« ඔවුහු එහි පුහු දෙයකට හෝ පාපය ඇති කරන කතාවකට හෝ සවන් නො දෙති. 'ශාන්තිය! ශාන්තිය!' යන පැවසීම මිස.»**

(අල්-වාකිආ: 25-26)

**අල්ලාහ්ගේ ගැත්තනි,** නියත වශයෙන්ම දුක්ඛදොමනස්සයන් සහ කනගාටුව අල්ලාහ් තආලා වෙත යන මාර්ගයේ දී ඇතිවන තාවකාලික බාධාවන් වේ. එබැවින් අල්ලාහ් තආලා තම ග්‍රන්ථයේ (කුර්ආනයේ) කිසිදු ස්ථානයක ඒ සඳහා අණ කර නොමැත, ඒවා අගය කර නොමැත, තව ද ඒවා සෙවීම වෙනුවෙන් කිසිදු පලයක් හෝ තිළිණයක් නියම කරද නැත. ඒ වෙනුවට බොහෝ ස්ථානවලින් ඒවා තහනම් කර ඇත. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**«නුඹලා අධෛර්යවත් නො වන්න, දුක් නො වන්න. නුඹලා සැබෑ විශ්වාසවන්තයින් නම්, නුඹලාමය උසස් වන්නෝ.»**

(ආල ඉම්රාන්: 139)

එබැවින් යම් ගැත්තෙකුට හැකි උපරිමයෙන් දුක සහ දුක්ඛදෝමනස්සයන් දුරු කර ගැනීමට උත්සාහ කිරීම අනිවාර්ය වන අතර, ඒවා පස්සේ නොයා යුතු ය. එම නිසා ම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ ඒවායින් ආරක්ෂාව පතා මෙසේ ප්‍රකාශ කළහ:

**«අල්ලාහ් දෙවියනි, කනගාටුවෙන්, දුකෙන්, අසමත්කමෙන්, අලසකමෙන්, මසුරුකමෙන්, බියගුලුකමෙන්, ණය බරින් සහ මිනිසුන්ගේ යටපත් කිරීමෙන් (අධිපතිභාවයෙන්) මම ඔබගෙන් ආරක්ෂාව පතමි.»**

(අනස් රළියල්ලාහු අන්හු තුමාණන් විසින් රිවායත් කරන ලද බුහාරි හදීසය)

තවද යම් ගැත්තෙකුට තම සහෝදරයා කනගාටුවකින් හෝ දුකකින් සිටිනු දක්නට ලැබුණු විට, ඔහුගේ කනගාටුව හා දුක දුරු කිරීමට උත්සාහ කිරීමත්, ඔහුගේ දුක නැති කරන සහ සිත සනසවන සුළු දේ කතා කිරීමත් සුන්නත් වේ. අල්ලාහ් තආලා තම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ගැන මෙසේ පවසයි:

**«ඔහු තම මිතුරාට, 'දුක් නොවන්න, නියත වශයෙන්ම අල්ලාහ් අප සමඟ සිටින්නේය'යි පැවසූ අවස්ථාවේ දී...»**

(අත්-තව්බා: 40)

තවද උමර් රළියල්ලාහු අන්හු තුමාණෝ මෙසේ පැවසූහ:

**«මම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ව සිනස්සවන යමක් කියන්නෙමි.»**

(ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය විසින් රිවායත් කරන ලද බුහාරි සහ මුස්ලිම් හදීසය)

**මුස්ලිම්වරුනි,** නියත වශයෙන්ම දුක සහ කනගාටුව දුරු කර ගැනීමට බලපාන ප්‍රධානතම හේතුවක් වන්නේ: **දේව නියමය (අල්-කළා) සහ පූර්ව නියමය (අල්-කදර්) කෙරෙහි විශ්වාසය තැබීමත්**, අල්ලාහ් තආලා යම් ගැත්තෙකුට නියම කරන දේ වළක්වාලිය නොහැකි අයුරින් එය සිදුවන බව පිළිගැනීමත් ය.

අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**« මහපොළොවෙහි හෝ නුඹලා තුළ හෝ කවර විපතක් සිදු වුව ද ඒවා අපි ඇති කිරීමට පෙර ම ග්‍රන්ථයේ ලියා තිබීමෙන් මිස නො වීය. නියත වශයෙන් ම එය අල්ලාහ් වෙත පහසු කාර්යයකි. නුඹලාට අතපසු වූ දෑ ගැන නුඹලා දුක් නො වනු පිණිසත් ඔහු නුඹලාට පිරිනැමූ දෑ ගැන නුඹලා සතුටින් ඉහවහා නො යනු පිණිසත් ය. තවද පුරසාරම් දොඩන අහංකාර සෑම කෙනෙකු ව ම අල්ලාහ් ප්‍රිය නො කරයි.»**

(අල්-හදීද්: 22-23)

තවද මෙම විශ්වාසය යහපත් ක්‍රියාවන් සමඟ එකතු විය යුතු ය. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**« යම් පිරිමියකුගෙන් හෝ වේවා කාන්තාවකගෙන් හෝ වේවා දේවත්වය විශ්වාස කරන්නෙකු ලෙස සිට යමෙකු දැහැමි කටයුත්තක් කළේ ද එවිට යහපත් ජීවිතයක් අපි ඔහුට උදා කරන්නෙමු. තවද ඔවුන් සිදු කරමින් සිටි දැට ඉතා යහපත් අයුරින් ඔවුන්ගේ ප්‍රතිඵල අපි ඔවුනට පිරිනමන්නෙමු..»**

(අන්-නහ්ල්: 97)

තවද නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ,

**«විශ්වාසවන්තයාගේ (මුඃමින්ගේ) කටයුතු පුදුමාකාර ය! නියත වශයෙන්ම ඔහුගේ සියලු කටයුතු යහපතක්ම ය. එය විශ්වාසවන්තයෙකුට හැර වෙනත් කිසිවෙකුට හිමි නොවේ. ඔහුට යම් සතුටක්/සහනයක් ලැබුණහොත් ඔහු (අල්ලාහ්ට) කෘතඥ වේ, එය ඔහුට යහපතක් වේ. ඔහුට යම් දුකක්/විපතක් සිදු වුවහොත් ඔහු ඉවසයි, එය ද ඔහුට යහපතක් වේ.»**

(සුහෛබ් ඉබ්නු සිනාන් රළියල්ලාහු අන්හු තුමාණන් විසින් රිවායත් කරන ලද මුස්ලිම් හදීසය)

තවද දුක සහ කනගාටුව දුරු වීමේ හේතු අතර:

**නබිවරුන් සහ යහපත් ජනයා ව ආදර්ශයට ගැනීමත්, ඔවුන්ව පරමාදර්ශයක් ලෙස සැලකීමත්** ඇතුළත් වේ. මන්ද ඔවුහු මහත් වූ පරීක්ෂණවලට ලක් වූ අතර, ඒ කෙරෙහි ඉවසීමෙන් කටයුතු කළහ.

සඃද් ඉබ්නු අබී වක්කාස් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් රිවායත් වේ, එතුමා මෙසේ පැවසීය:

මම, **«ඕ අල්ලාහ්ගේ දූතයාණනි! මිනිසුන් අතුරින් වඩාත්ම දැඩි පරීක්ෂණවලට ලක් වන්නේ කවුරුන්ද?»** යි ඇසුවෙමි.

එතුමාණෝ මෙසේ පිළිතුරු දුන්හ: **«නබිවරුන්ය, පසුව ඔවුන්ට වඩාත් ආසන්න යහපත් ජනයා ය, ඉන්පසු ඔවුන්ට ආසන්න අය යි. මිනිසෙකු ඔහුගේ දහමේ (විශ්වාසයේ) ප්‍රමාණයට අනුව පරීක්ෂා කරනු ලැබේ. ඔහුගේ දහම තුළ ඔහු ශක්තිමත් නම්, ඔහුගේ පරීක්ෂණය දැඩි වේ. ඔහුගේ දහම තුළ යම් ලිහිල් බවක් තිබේ නම්, ඔහුගේ දහමේ ප්‍රමාණයට අනුව ඔහු පරීක්ෂා කරනු ලැබේ. යම් ගැත්තෙකුගේ කිසිදු පාපයක් ඉතිරි නොවී, ඔහු පොළොව මත ඇවිද යන තෙක් ම පරීක්ෂණය ඔහුව අතහැර යන්නේ නැත.»**

*(තිර්මිදි තුමා විසින් වාර්තා කරන ලද අතර අල්-අල්බානි තුමන් විසින් සහීහ් ලෙස වර්ගීකරණය කරන ලදී)*

තවද දුක සහ කනගාටුව දුරු වීමේ තවත් හේතුවක් වන්නේ:

**සෙසු මිනිසුන්ගේ දුක් කරදර දුරු කිරීම සහ ඔවුන්ට යහපත (උපකාර) කිරීම යි.** මන්ද, ප්‍රතිඵලය ලැබෙන්නේ යමෙකු කරන ක්‍රියාවේ ස්වභාවයට අනුකූලව ය.

සහීහ් මුස්ලිම් ග්‍රන්ථයේ අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් වාර්තාවන හදීසයක, අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) මෙසේ ප්‍රකාශ කළහ:

**«යමෙකු විශ්වාසවන්තයෙකුගේ මෙලොව දුක් කරදරවලින් එක් දුකක් දුරු කරන්නේ ද, අල්ලාහ් තආලා විනිශ්වය දිනයේ දුක් කරදරවලින් එක් දුකක් ඔහුගෙන් දුරු කරන්නේය. යමෙකු අසීරුතාවයට පත්වූවෙකුට (ණය ගැතියෙකුට/තදබල ලෙස අසරණ වූවෙකුට) පහසුවක් කර දෙන්නේ ද, අල්ලාහ් තආලා ඔහුට මෙලොව දී සහ පරලොව දී පහසුව උදාකර දෙන්නේය. යමෙකු මුස්ලිම්වරයෙකුගේ (අඩුපාඩුවක) වසන් කරන්නේ ද (ආරක්ෂා කරන්නේ ද), අල්ලාහ් තආලා ඔහුගේ (අඩුපාඩු) මෙලොව දී සහ පරලොවදී වසන් කරන්නේය. තවද යම් ගැත්තෙකු තම සහෝදරයාට උපකාර කරන තාක් කල්, අල්ලාහ් තආලා එම ගැත්තාගේ උපකාරයට සිටින්නේය.»**

ඔබ සැම සවන් දෙන මෙම වචන මම පවසමින්, මට සහ ඔබ සැමට අල්ලාහ්ගෙන් ක්ෂමාව පතමි. එබැවින් ඔබ ද ඔහුගෙන් ක්ෂමාව අයැද සිටින්න. නියත වශයෙන්ම ඔහු ඉතා ක්ෂමාශීලී, අති කරුණාබර තැනැත්තාණෝ ය.

## දෙවන ඛුත්බාව (දේශනය)

සියලු ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ්ට ම සකල ප්‍රශංසා හිමි ය. උසස් වූ ප්‍රශංසාව සහ අලංකාර වූ ස්තුති ය ඔහුට ම ය. අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බවත්, ඔහු ඒකීය බවත්, ඔහුට කිසිදු සහකරුවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. ඔහු සත්‍යය ම පවසයි, තවද ඔහු (නිවැරදි) මාර්ගය පෙන්වා දෙයි. තවද මුහම්මද් යනු අල්ලාහ්ගේ ගැත්තා සහ දූතයාණන් වන බවට ද මම සාක්ෂි දරමි. අල්ලාහ්ගේ ශාන්තිය සහ ප්‍රශංසාව එතුමාණන්ට ද, එතුමාණන්ගේ පවුලේ උදවියට ද, සගයන්ට ද විනිශ්වය දිනය දක්වා අතිමහත් ලෙස අත් වේවා!

දුක සහ කනගාටුව දුරු කර ගැනීමේ විශාලතම හේතු අතර:

**දුආ (ප්‍රාර්ථනා) කිරීම සහ අවනතවීම් මඟින් අල්ලාහ් වෙත යොමු වීමත්, සුවිශුද්ධ ඔහු ව අධික ලෙස සිහිපත් (තික්ර්) කිරීමත්** ඇතුළත් වේ. මන්ද, තමන් වෙත යොමු වන කිසිවෙකු ව ඔහු ව අතහරින්නේ නැත. ඔහු අතිශයින් කරුණාවන්ත, අතිශයින් අනුකම්පා සහගත තැනැත්තාණෝ ය. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**« එසේ නැතහොත් කරදරයක පැටලුණු අය ඔහුගෙන් ප්‍රාර්ථනා කළ විට ඔහුට පිළිතුරු දී එම නපුර ඉවත් කරන්නා (උතුම්) ද? තවද, ඔහු නුඹලා මහපොළොවේ නියෝජිතයින් බවට පත් කරයි. අල්ලාහ් සමඟ තවත් දෙවියකු සිටී ද? නුඹලා මෙනෙහි කරනුයේ සුළු වශයෙනි.»**

(අන්-නම්ල්: 62)

තවද අල්ලාහ් තආලා මෙසේ පවසයි:

**« තවද නියත වශයෙන් ම නුඹේ හදවත ඔවුන් පවසන දැයින් පීඩනයට පත්ව ඇති බව සැබැවින් ම අපි දනිමු. එහෙයින් නුඹ නුඹගේ පරමාධිපතිගේ ප්‍රසංශාව තුළින් පිවිතුරු කරනු. තවද නුඹ සිරස නමා සුජූද් කරන්නන් සමඟ වනු.»**

(අල්-හිජ්ර්: 97-98)

තවද අපගේ නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්, දුක සහ කනගාටුව ඇති වන විට අප විසින් ප්‍රාර්ථනා කළ යුතු ශ්‍රේෂ්ඨ දුආ (ප්‍රාර්තනාවක්) පිළිබඳව අපට මඟපෙන්වා ඇත.

ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් රිවායත් වේ, අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) මෙසේ ප්‍රකාශ කළහ:

**«යම් කිසිවෙකුට දුකක් හෝ කනගාටුවක් පැමිණි විට, ඔහු මෙසේ පැවසුවේ නම්:**
***'අල්ලාහ් දෙවියනි, නියත වශයෙන්ම මම ඔබගේ ගැත්තා වෙමි, ඔබගේ ගැත්තෙකුගේ පුතු වෙමි, ඔබගේ ගැහැණු ගැත්තියකගේ පුතු වෙමි. මගේ පෙරමුණ හිස ඔබගේ අතෙහි ඇත. මා කෙරෙහි ඔබගේ තීරණය ක්‍රියාත්මක වේ. මා කෙරෙහි ඔබගේ නියමය සාධාරණ ය. ඔබ ඔබට ම තබාගත්, නැතහොත් ඔබගේ ග්‍රන්ථයේ පහළ කළ, නැතහොත් ඔබගේ මැවීම්වලින් කාට හෝ උගන්වන ලද, නැතහොත් ඔබ සතු අභිරහස් (අදෘශ්‍යමාන) දැනුමෙහි රඳවාගත් සෑම නාමයකින්ම මම ඔබගෙන් ඉල්ලා සිටිමි; කුර්ආනය මගේ සිතේ වසන්තය ද, මගේ ළයේ ආලෝකය ද, මගේ දුක දුරු කරන මාර්ගය ද, මගේ වේදනාව නැති කරන මාර්ගය ද බවට පත් කරන මෙන් ඉල්ලමි.'***
**අල්ලාහ් තආලා ඔහුගේ දුක සහ වේදනාව නැති කර, ඒ වෙනුවට සහනය (සන්තෝෂය) ලබා දෙන්නේම ය.»**
**එවිට, «අල්ලාහ්ගේ දූතයාණනි, අපි මෙය ඉගෙන ගත යුතු නේද?» යි විමසන ලදී.**
**එතුමාණන්, «එසේ ය, මෙය සවන් දෙන ඕනෑම අයෙකු මෙය ඉගෙන ගැනීම අවශ්‍යය.» යි පැවසූහ.**

(අහ්මද් විසින් වාර්තා කරන ලද අතර අල්-අල්බානි විසින් සහීහ් ලෙස වර්ගීකරණය කරන ලදී)

තවද සහීහ් බුහාරි සහ මුස්ලිම් ග්‍රන්ථයන්හි ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමාණන්ගෙන් රිවායත් වන පරිදි, නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ තදබල දුක් කරදර ඇති වූ විට මෙසේ පවසමින් සිටියහ:

**«මහානුභාව සම්පන්න වූ ද, (දඬුවම් කිරීමට ඉක්මන් නොවන) ගුණයෙන් යුක්ත වූ ද අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැත. ශ්‍රේෂ්ඨ වූ අර්ෂ්හි (සිංහාසනයේ) පරමාධිපති වන අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැත. අහස්හි පරමාධිපති ද, පොළොවෙහි පරමාධිපති ද, ගෞරවනීය අර්ෂ්හි පරමාධිපති ද වන අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැත.»**

අපගේ දුකපීඩා දුරු කරන ලෙසත්, අපගේ දුක් කරදර නැති කරන ලෙසත්, ශ්‍රේෂ්ඨ වූ කුර්ආනය අපගේ සිත්හි වසන්තය බවට පත් කරන ලෙසත් අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටින්නෙමු.

අල්ලාහ් දෙවියනි, ඔබගේ ගැත්තා සහ නබිවරයාණන් වන මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට ප්‍රශංසා හා ශාන්තිය අත් කර දෙනු මැනව. තවද එතුමාණන්ගේ ඍජු මඟ ලත් හලීෆාවරුන් (අබූ බකර්, උමර්, උස්මාන්, අලි රළියල්ලාහු අන්හුම්) කෙරෙහි ද, විශ්වාසවන්තයින්ගේ මැණිවරුන් වන එතුමාණන්ගේ බිරින්දෑවරුන් කෙරෙහි ද, සගයන් (සහාබාවරුන්) සියලු දෙනා කෙරෙහි ද, විනිශ්චය දිනය දක්වා යහපත් මඟින් ඔවුන් ව අනුගමනය කළ අය කෙරෙහි ද, ඔබගේ ත්‍යාගශීලීභාවයෙන් හා කරුණාවෙන් ඔවුන් සමඟ අප කෙරෙහි ද තෘප්තිමත් වන්න; අතිශයින් ත්‍යාගශීලී තැනැත්තාණනි!

අල්ලාහ් දෙවියෙනි, අපට ඊමානය (විශ්වාසය) ප්‍රියජනක කර, එය අපගේ සිත් තුළ අලංකාරවත් කරනු මැනව. ප්‍රතික්ෂේපය (කුෆ්ර්), පාපතර බව සහ අකීකරුවීම අපට අප්‍රිය කරනු මැනව. තවද අප ව ඍජු මඟ ලත් අය අතුරින් පත් කරනු මැනව!.

අල්ලාහ් දෙවියෙනි, ඉස්ලාමය සහ මුස්ලිම්වරුන් බලවත් කරනු මැනව.

අල්ලාහ් දෙවියෙනි, කුවේට් දේශය සහ එහි වැසියන් සියලු නපුරෙන් හා අයහපතෙන් ආරක්ෂා කරනු මැනව. මෙම රටත්, අන් සියලු මුස්ලිම් රටවල්ද ආරක්ෂිත, ශාන්තිමත් ස්ථානයක් බවට පත් කරනු මැනව.

අල්ලාහ් දෙවියෙනි, දේශසීමා ආරක්ෂකයින්, ආරක්ෂක හමුදා, ආරක්ෂක බලකා, ජාතික ආරක්ෂක බලකා, ගිනි නිවන හමුදාව සහ රටේ ආරක්ෂාව වෙනුවෙන් කැපවී සිටින සියලු දෙනා වන අපගේ සහෝදරයින් ව ආරක්ෂා කරනු මැනව. ඔවුන්ගේ පාද (සථිර ව) තබනු මැනව.

අල්ලාහ් දෙවියෙනි, අපගේ නායකයාට (අමීර්වරයාට) සහ ඔහුගේ ඔටුන්න හිමි කුමරුට ඔබ ප්‍රිය කරන සහ තෘප්තිමත් වන දේ සඳහා මඟපෙන්වනු මැනව. පින සහ බියභක්තිය වෙත ඔවුන්ව යොමු කරනු මැනව.

**සියලු ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ්ට ම සකල ප්‍රශංසා හිමි වේවා! යන අවසන් ප්‍රාර්ථනාවෙන් අවසන් කර ගනිමි!**

**(ආදර්ශ සිකුරාදා දේශනා සම්පාදනය කිරීමේ කමිටුව)**